# 59

# තණ්හා සංකල්පයෙන් ප්‍රකට කරන අභිප්‍රේරණ ලක්ෂණ

*මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි*

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ සොයාගැනීම චතුරාර්ය සත්‍ය වශයෙන් අපි හඳුන්වමු. එනම් දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන කරුණුයි. දුක්ඛ සත්‍යයෙන් පෙන්වා දෙන්නේ ලොව යථා තත්ත්වයයි. සමුදය නම් එම දුකෙහි හේතුවයි. නිරෝධය නම් එහි පැවැත්ම වැළැක්මයි. මග්ග නම් ඒ වැළැක්ම නැවැත්ම සඳහා අනුගමනය කළ යුතු මගයි. මෙය ම තවත් ආකාරයකින් පටිච්ච සමුප්පාද නාමයෙන් උගන්වනු ලැබේ. පටිච්ච යන්නෙන් හේතුවත් සමුප්පාද යන්නෙන් ඵලයත් හඳුන්වා ඇති බව සරල ව දැක්විය හැකිය. පටිච්ච සමුප්පාදයේ අතිගම්භීරතාව හේතු කොට ගත් විට ස්කන්ධ ලෝකයේ පැවැත්ම නැවැත්ම යන දෙකරුණ මේ ධර්මයෙන් ඉගැන්වේ. ලොව දුක් සහගතබව තේරුම් ගැනීමත් එය නැවැත්වීමේ මගක් ඇති බවත් එයින් බෞද්ධයා තේරුම් ගනී. බුදු දහම නිවත්ති මගකයි කියනුයේ එනිසයි. එය තව දුරටත් තේරුම් ගැනීමේ දී පවත්නා දුකට හේතුවක් ඇති බවත් ඒ හේතුව සිඳ දැමීම ම නිවන බවත් එය සඳහා අනුගමනය කළ යුතු මග ආර්ය අෂ්ටාංගික මාර්ගය බවත් තණ්හාව විශේෂයෙන් දැනීම පිණිස, පිරිසිඳු දැනීම පිණිස, ගෙවීම පිණිස, පෑහීම පිණිස, ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය[1] කළ යුතු යැයි බුදු දහමෙන් පැහැදිලි කොට ඇත. එය දුක උපදවන හේතුව තණ්හාව ම බව පෙන්වා දී තිබේ.

උත්පත්ති, ජරා, මරණාදි වශයෙන් විද්‍යමාන දුක් සියල්ල ඇති වන්නේ තණ්හා හෙවත් විෂය රසයෙහි දක්වන ඇලීම, බැඳීම, ගිජුකම වශයෙන් හැඳින්විය යුතුය. සත්ත්වයා සතු පංචස්කන්ධය මේ තෘෂ්ණාව මුල්කොට ගෙන පවතී.[2] එම තණ්හාව කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් ධර්මයෙහි වර්ගීකරණය කොට ඇත. තණ්හා තණ්හා යැයි කියති. තණ්හා කුමක් ද? එය තුනකි. කාම, භව හා විභව තෘෂ්ණාවයි.[3] එහිලා කාම වශයෙන් හඳුන්වා ඇත්තේ ඉන්ද්‍රියයන් පිනවීමට අප තුළ ඇති වන ආශාවයි. සත්ත්වයා උපතේ සිට මිය යන තුරු ම අපේක්ෂා කරන්නේ ඉන්ද්‍රියයන් පිනවීමයි. ඇසින් දැක්ක යුතු වූ ප්‍රියමනාප ස්වභාවය ඇති කම් සැප ගෙන දෙන රූපයන් ඇත. ඒ ගැන සතුටුවන සිතන පුද්ගලයාට ආශාව උපදී.[4] කණ, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියයන්ට හසුවන ප්‍රිය ශබ්ද, ගන්ධ, රස, පහස යන සියල්ල ද එසේය. ඉන්ද්‍රියයන් පිනවීමට අවශ්‍ය වන අරමුණු පසුපස හඹා යෑම



කාම තණ්හාවෙන් සිදුවන කාර්යයයි. ලෝකයේ ජීවත් වන මිනිස්සු සතුටක් ලබාගත හැකි දේ සොයා යෑමත් දුක් යැයි පිළිගන්නා අම්හිරි දෙයින් වෙන් වීමටත් විශේෂ උනන්දුවක් දක්වන බව ඉතා පැහැදිලි කරුණකි. මේ අරමුණු සත්ත්වයන්ගේ ඉන්ද්‍රිය පිනවීමේ කැමැත්ත මුල් කොට පහළ වන එකකි. ඔහුට වැටහෙන වේදනාවේ ස්වරූපයෙන් පහළ වේ. සත්ත්වයා සැප යයි සලකන්නේ ඔහුට මුහුණ පාන්නට සිදුවන දුක ආවරණය කිරීමේ ප්‍රතිකර්මයකි. ඒ හැර සැප යයි වෙන්කොට දැක්විය හැකි විඳීම් විශේෂයක් ලෝකයේ ඇත්තේ නො වේ. වණ රෝගයක් ඇති පුද්ගලයා එම වණය කැසීම සිදු කරන්නේ කැසීම නිසා තාවකාලික ව එහි වේදනාව දුරු වන නිසාය.[5] නින්ද සැපයක් ලෙස සලකන්නේ නිදාගැනීම නිසා ශරීරයේ ඇති වන විඩාව, මහන්සිය සංසිඳෙන බැවිනි. කාම තෘෂ්ණාවෙන් වේදනාව ගෙන දෙන්නේ දැවෙන්නේ සේවනය කරන්නේ ස්වල්ප මාත්‍ර ආස්වාදයක් ම එයින් ලබන නිසාය. මේ නයින් සලකන කල සත්ත්වයා සැප යැයි සලකන සෑම ක්‍රියාවක් ම වැසී ඇති ස්වරූපය දුකට කරන පිළියමක් බව පැහැදිලිය. ඒ සැපයට ඇති කැමැත්ත නිසා එබඳු දේ සොයා යෑමට පෙළඹවීම ඇති වන්නේ සහ ක්‍රියාත්මක වන්නේ පුද්ගලයාගේ සිතෙහි පවත්නා කැමැත්ත නිසාය.[6] බුදු දහමෙන් උගන්වන මෙම කැමැත්ත මානුෂික තත්ත්වය බටහිර මනෝවිද්‍යාඥයින් ද පිළිගන්නා කරුණකි. මේ තත්ත්වය පැහැදිලි කරන බුදු දහම කාම යන වචනය වස්තු කාම, ක්ලේශ කාම යන දෙයාකාරයෙන් ම විස්තර කොට තිබේ.[7] එහි වස්තු කාම යන්නෙන් අදහස් කරන්නේ ඇස, කණ, නාසය, දිව, ශරීරය මගින් බාහිර ලෝකයෙන් හසුවන රූප ශබ්ද ආදිය ඇසුරු කොට ලැබෙන සුවයට දක්වන කැමැත්තයි. ක්ලේශ කාම නම් ඒ සඳහා පුද්ගලයා පොලඹවන යොමු කරවන ආසාවන් පිරි මානසික තත්ත්වයයි. එම මානසික පෙලඹවීම නිසා ම පුද්ගලයා ඉඳුරන් පිනවන අරමුණු පසුපස යෑම සිදුවේ. මෙකී පෙලඹවීම නැත්නම් ඉඳුරන් තිබුණ පලියට හෝ ඒවාට ගොදුරුවන අරමුණ තිබුණු පලියට වස්තු කාම ක්ලේශ කාම ක්‍රියාත්මක නො වේ. මේ ඉඳුරන් අරමුණු ලෙස ඇදීමත් අරමුණු මගින් ඉඳුරන් ඇදගැනීමත් මෙකී මානසික පෙලඹවීම මත සිදුවන අයුරු මනෝ විද්‍යාඥයින්ගේ ද පිළිගැනීමයි. මෙයින් අනාවරණය වන සත්‍ය නම් තෘෂ්ණාව නමැති මානසික තත්ත්වය කාමාශාවන් පසුපස දිවීමේ හේතුව බවයි.

**භව තණ්හා** - භව තණ්හා නම් පැවැත්ම පිළිබඳ ව දක්වන ආසාවයි. එය නිරන්තරයෙන් ම මමය මාගේය යන සිතිවිලි හා බැඳීපවත්නා පැවැත්ම පිළිබඳ ආශාවයි. පුහුදුන් සිත්වල නිරන්තරයෙන් ම මේ මාගේය, මෙය මම වෙමි, මේ මාගේ ආත්මයයි[8] යනුවෙන් බැඳී පවත්නා සැඟවුණු ආත්ම සංකල්පයක් පවතී. ඒ නිසා තමන්ගේ පැවැත්ම පිළිබඳ ඇති කරගන්නා ආශාව භව තණ්හා වශයෙන් බුදු දහමෙහි හඳුන්වා දී තිබේ. මෙය පුනර්භවය ඇති කිරීමට එහි නන්දි

රාගය ඇති කිරීමට ඒ ඒ තන්හි ඇලීමට හේතුවන මානසික තත්ත්වයකි. ජීවත් වීමට කැමති වීමත් මරණයට නොකැමති වීමත් ඒ ඒ අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීමට ක්‍රියාත්මක වීමත් යන මිනිස් ක්‍රියාකාරකම් පෙලඹෙන්නේ මේ සැඟවුණු ආත්මීය සංකල්පය හා එය පවත්වා ගැනීමේ[9] ආශාව මතය. බුදු සමය අනුව මෙය එක්තරා විදිහකින් භව රාගයකි. භව රාගය පවත්නා තාක් කල් ප්‍රවෘත්තියේ හෙවත් සසර පැවැත්මක් බලාපොරොත්තු විය නොහැක. එපමණක් නොව භව රාගය සක්කාය දිට්ඨිය නමැති සංකල්පයට මුළුමනින් ම අනුබල දෙන්නකි. භව රාගය හා බැඳී පවත්නා ආත්ම දෘෂ්ටිය මානය වැනි මානුෂික තත්ත්වයන් සපුරා ගැනීම සඳහා ක්‍රියා කරයි. එය මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන නාසිවාදය හා ගැළපෙන බව පෙනේ.[10] මෙම භව තණ්හාව ආසවයක් හැටියට ද සිතෙහි බලපවත්නා තත්ත්වයකි. මෙය ආශ්‍රවක්ෂය නුවණින් ඇති කරගන්නා මිදීම දක්වා ම සිතෙහි බලපවත්නා තත්ත්වයකි. භවාසවය සහමුලින් ම සිඳීයන්නේ රහත්බව ලැබීමෙන් පමණකි.[11] රහතන් වහන්සේ හැර අන් සියල්ලන්ගේ ම පැවැත්ම භවයන්ගෙන් ගහනය වෙත්. රහතන් වහන්සේගේ ජීවිතයට මාගේ පැවැත්ම යන හැඟීමක් ඇති නො වේ. උන් වහන්සේ මුළුමනින් ම අස්මිමානය නසාලූ හෙයින් කාම භව, රූප භව, අරූප භව වශයෙන් තුන් අයුරකින් පවත්නා භවය තණ්හාවේ ප්‍රතිඵලයකි. හෙවත් මමත්වයේ පැවැත්මකි. මේ පැවැත්ම සුරක්ෂිත කිරීම පිණිස පදනම් වූ සියලු ක්‍රියාකාරකම් තෘෂ්ණාව හා බැඳී පැවතියේය. ප්‍රොයිඩ්ගේ ආත්ම මායාව පිළිබඳ අදහස ඔහුගේ භවාසය හා සම්බන්ධ ව පවත්නා බව පෙන්වා දී ඇත. ඒ පිළිබඳ දක්වෙන විස්තර බුදු දහමේ උගන්වන මනෝ සංචාර මනෝ සඤ්චේතනාහාර යන සංකල්ප හා සම්බන්ධ කිරීමට හැකි බව සමහරු කල්පනා කරති.[12]

විභව තණ්හා - තෘෂ්ණාවේ ම තුන්වන කොටස හැටියට දක්වෙන විභව තෘෂ්ණාව කෙබඳු දැයි විමසා බැලිය යුතුය. සූත්‍ර ධර්මවල තණ්හා, ඡන්ද, රාග, නන්දි යන වචන 'යායං තණ්හා පොනෝභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභි නන්දිනී'[13] ආදි වශයෙන් එකට යෙදී තිබේ. මේ එක් එක් අවස්ථා තණ්හාව පදනම් කරගෙන ඇතිවන එකිනෙකට විශේෂ තත්ත්ව බව හැඳිනගත යුතුය. පැවැත්ම භව නමින් හැඳින්වූවාක් මෙන් ම භවයක් නැත කියන්නාක් මෙන් සිතේ ඇතිවන තත්ත්වය විභවයයි. ඒ මත එයට දක්වන ඇල්ම බැඳීම ආසාව විභව තණ්හා යන නමින් හැඳින්වේ. හුදෙක් මෙය භව නිරෝධයක් නො වේ. සතර මහා භූතයන්ගෙන් හටගත් මව්පියන්ගේ එක්වීමෙන් හටගත් රූපී ආත්මය කය බිඳී යෑමෙන් සිඳී යයි නම් වැනසී' යයි නම් මරණින් පසු ඇති නොවේ නම් මෙපමණකින් ම මේ ආත්මය මුළුමනින් ම සංසිඳී යයි කියා එයට දක්වන උච්ඡේදයට වැටෙන හැඟීම එයට දක්වන ආශාව විභව තණ්හාවයි.[14] මෙයින් ආත්මයක් පිළිගන්නා අතර ම මමය මාගේය යන හැඟීම තහවුරු කරයි. මෙයින් සිදුවන්නේ සත්ත්වයාගේ උච්ඡෙදය



පිළිගැනීමයි. සක්කාය දිට්ඨියට බියෙන් සක්කාය දිට්ඨියට පිළිකුළෙන් එහි ම කරකැවීම සිදුවේ. ඒ සඳහා ආසා කරයි. ක්‍රියාත්මක කරයි. භව නිරෝධයට කැමති නො වෙති. ඇතැම් අය අතිධාවනය කරති. භවය නිසා ලැජ්ජාවට පැමිණ උච්ඡේදයට කැමති වෙති. එය නිවන් මගෙහි සිත ඉක්මවා යෑමයි.[15] ප්‍රොයිඩ්ගේ අදහස අනුව විභවාසය මූලික වශයෙන් බාහිර ලෝකයට විරුද්ධ ව ද එල්ලවන්නකි.[16] මේ විග්‍රහයන් සසඳා බැලීමේ දී විභවාසය තමන්ගේ විනාශය කෙරෙහි යොමුවන අතර බුදුසමය විභව තණ්හාව ම හිංසකත්වය පදනම් කරගත්තක් බව පෙන්වා දී ඇත. මේ අනුව සමහර විට විභව තණ්හා පාදක වීමෙන් සිය දිවි හානිකර ගැනීමට පවා මිනිසුන් පෙලඹී යනු ඇති. කෙසේ වෙත් කාම, භව, විභව යන ත්‍රිවිධ තණ්හාව ආධ්‍යාත්මික බාහිර වශයෙන් හිංසාවට හා භව බන්ධනයට තුඩු දෙන්නක් මිස කිසිසේත් සංසාර බන්ධනය සිඳ දැමීමට හේතු වන්නක් නො වේ. එය බුදුරජාණන් වහන්සේ අවධාරණය කොට ඇත්තේ භව බන්ධනය නැසීම නම් එම තණ්හාවගේ නිරවශේෂ නිරෝධයයි. 'යෝ තස්ස යේව තණ්හාය අසේස විරාග නිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ'[17]

බුදු දහමේ ඉගැන්වෙන පරිදි කාම, භව, විභව වශයෙන් මිනිස් සිත්වල ඇතිවන ඡන්ද, රාග, නන්දි, තණ්හා යන නම්වලින් හැඳින්වෙන තණ්හාව මනෝවිද්‍යාඥයනගේ ඉගැන්වීම් අනුව ද මානසික පැවැත්මක් බව පෙනී යයි. ඒ කවර නමකින් ඉගැන්වූව ද ආශාව ලෞකික ලෝකෝත්තර ජීවිතයට බලපාන ආකාරය එයින් ඇතිවන අනර්ථය බුද්ධ ධර්මයේ පෙන්වා දී ඇති සැටි විමර්ශනය කිරීම වැදගත් වේ. 'තණ්හං පටිච්ච පරියේසනා පරියේසනං පටිච්ච ලාභෝ ලාභං පටිච්ච විනිච්ඡයෝ විනිච්ඡයං පටිච්ඡ ඡන්ද රාගෝ ඡන්ද රාගං පටිච්ච අජ්ඣෝසානං අජ්ඣෝසානං පටිච්ච පරිග්ගහෝ පරිග්ගහං පටිච්ච මච්ඡරියං මච්ඡරියං පටිච්ච ආරක්ඛෝ ආරක්ඛාධි කරණං පටිච්ච දණ්ඩාදනං සත්ථාදනං කලහ විග්ගහ විවාද තුවං තුවං පේසුඤ්ඤ මුසාවාද අනේකේ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති'[18] තණ්හාව නිසා පරියේෂණය නම් වූ කැමති දේවල් සෙවීමත්, සෙවීම නිසා ලැබීමත්, ලැබීම නිසා ඒ ලැබූ දේවල් සම්බන්ධයෙන් යම් යම් තීරණ ගැනීමත් ඒ තීරණ අනුව ඒවා පිළිබඳ දැඩි ඇලීම් මුල් කොටගෙන ඒවා සම්බන්ධයෙන් මුළාවට පත්වීමත්, එම ඇලීම නිසා වහලෙකු වීමත්, මසුරුබව නිසා ආරක්ෂා කිරීමත්, ආරක්ෂා කිරීමට අවිආයුධ දඬු මුගුරු ගැනීමත්, අවිආයුධ දඬු මුගුරු නිසා කලකෝලාහල, වාද විවාද, යුද්ධ, බැණගැනීම්, බොරු කේලාම් වැනි නොයෙක් අකුසල ධර්මයන් හටගනී. මේ සියල්ලට ම පදනම් වන්නේ අපගේ ඉන්ද්‍රියයන් හා බාහිර විෂයයන් ගැටුණු විට ඇති වන වින්දනයන් හා එම වින්දන ආශ්‍රිත ව සිත තුළ ගොඩ නැගෙන තණ්හා මූලික උපකල්පනයන්ය.[19] ලොව පුරා හැම තැන විසිර ඇති ප්‍රභේද වශයෙන් එකසියඅට වැදෑරුම් මෙම තෘෂ්ණාව විසත්තිකා[20] යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

### පාදක සටහන්

1. තණ්හා සූත්‍රය, **සංයුත්ත නිකාය**, 51-130 පිටු.
2. මහා පුණ්ණම සූත්‍රය, **මජ්ඣිම නිකාය**, 3-116 පිටු.
3. තණ්හා සූත්‍රය, **සංයුත්ත නිකාය**, 4-482 පිටු.
4. පුණ්ණෝවාද සූත්‍රය, **මජ්ඣිම නිකාය**, 3-546 පිටු.
5. මාගන්දිය සූත්‍රය, **මජ්ඣිම නිකාය**, 2-296 පිටු.
6. **මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය**, මෛත්‍රී මූර්ති කේ. හිමි, 202 පිටු.
7. **මහා නිද්දේස පාලිය**, 1 පිටු.
8. අලගද්දූපම සූත්‍රය, **මජ්ඣිම නිකාය**, 1-338 පිටු.
9. සච්ච විභංග සූත්‍රය, **මජ්ඣිම නිකාය**, 3-51 පිටු.
10. **මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය**, 206 පිටු.
11. චූල සච්චක සූත්‍රය, **මජ්ඣිම නිකාය**, 1-556 පිටු.
12. **මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය**, 207 පිට.
13. ධම්ම චක්ක සූත්‍රය, **සංයුත්ත නිකාය**, 5, 2-270 පිටු.
14. බ්‍රහ්මජාල සූත්‍රය, **දීඝ නිකාය**, 1-60 පිට.
15. **පටිසම්භිදා මග්ග**, 463 පිට.
16. **මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය**, 210 පිට.
17. ධම්ම චක්ක සූත්‍රය, **සංයුත්ත නිකාය**, 5,2- 270 පිටු.
18. මහා නිධාන සූත්‍රය, **දීඝ නිකාය**, 2 - 86 පිට.
19. **ආදි බෞද්ධ දර්ශනය**, 64 පිට.
20. කාම සූත්‍රය, **සුත්ත නිපාතය**, 242 පිට.

# 60

# සිංහල සාහිත්‍ය විචාර ඉතිහාසය

*විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ. වී. සුරවීර*

සාහිත්‍ය කෘතියක් විචාරය කිරීම කවර මිම්මකට අනුව කළ යුතු ද යනු තව ම තීරණය වී නැති පැනයකි. මෙය ස්ථිර වශයෙන් තීරණය නොකළ හැක්කක් ද වනුයේ රුචිකත්වය කලින් කල වෙනස් වන හෙයිනි. ශ්‍රේෂ්ඨ සාහිත්‍ය කෘතියක් කාලයකට - දේශයකට හෝ භාෂාවකට සීමා විය යුතු නො වේ. එහෙත් ඒ ඒ යුගවල, රටවල සාහිත්‍යය පිළිබඳ විවිධ මත පහළ වී පැතිරී පැවති බව සැබෑවකි. සාහිත්‍යයේ පරමාර්ථය රස නිෂ්පත්තියය - හැඟීම් දනැවීමය. - මෙම කාර්යය හොඳින් ඉටු වූ තරමට කෘතියක උසස් බව කියැවේ" යනු සාහිත්‍යය පිළිබඳව වැඩි දෙනා විසින් අද පිළිගනු ලබන මතය සේ පෙනේ. එමෙන් ම කවදත් සාහිත්‍යාදී කලාවන් ගැන මහත් උනන්දුවක් ඇති වූ මෙරට සාහිත්‍යය පිළිබඳ ව කලින් කල නොයෙක් මත පහළ වන්නට ඇත. කුස ද කවට **කව් සිළුමිණ** නම පට බැඳුණේ එද පැවැති විචාර ක්‍රමය අනුව විය යුතුය. නූතන විචාරකයෝ එහිදු දෙස් තැන් දකිති. මේ සාහිත්‍ය විචාර මත කලින් කල වෙනස් වන අයුරුයි.

සාහිත්‍ය කෘතියක් විභාග කළ යුත්තේ - එහි රස විඳිය යුත්තේ එය ලියැවුණ අවධියේ බලපැවැත්වූ විචාර ක්‍රම උඩ පිහිටා යයි කීම සත්‍යයක් නො වේ. එහෙත් වර්තමාන රසිකයා විසින් ඒ කරුණු දනගනු ලැබීම එම කෘතිය වඩා හොඳින් අවබෝධ කරගැනීමට එහි රස විඳීමට ඉවහල් වේ. සාහිත්‍ය විචාර ඉතිහාසය ගැන වර්තමාන විචාරකයන්ගේ සිත් යොමුවිය යුත්තේ එහෙයිනි.

පැරණි අවධිවල මෙරට සාහිත්‍ය විචාරය අතින් උගතුන්ගේ සිත් යොමු වූයේ ගද්‍ය කෘතිවලට වඩා පද්‍ය සාහිත්‍යය කෙරෙහි බව පෙනේ. පද්‍යකරණය හා ඒ කෘති විභාග කිරීම පිළිබඳ පොත් කිහිපයක් කලින් කල සිංහලෙන් ලියැවී ඇති නමුත් ගද්‍යයට සීමාවූ එවැනි කෘතියක් ලියැවුණු බවක් අපට නො පෙනේ. මෙම විෂය පිළිබඳ ව අද විද්‍යමාන වන පැරණි ම කෘතිය වූ කලී **සියබස්ලකරයි**. **සියබස්ලකර** දසවැනි ක්‍රිස්තු ශතකයට හෝ තදාසන්න යුගයට අයත් වුවත් සිංහල සාහිත්‍යය විචාරයේ ආරම්භයට වඩා බොහෝ පැරණිය.

................ පෙර ගත් සකෙව්නිදු වූ (3)
................ පෙර ඇඳුරෝ ද නොකියත් (14)

කලා ගුරු සුලු පා - වැසි වූ කුළුණු නුවණ යුත්
කලණ මිතෙ වියතුන් - ගත්හි පියුම් ලකුණු ඇ (15)